# උඩරට අර්තාපල් ගොවියා මුහුණ දෙන ගැටලු (වැලිමඩ උඩුහාවර ග්‍රාමය ඇසුරෙන්)

**ඩබ්. ඩබ්. එම්. ටී. ඩී. විජේතුංග**[1]

**සංක්ෂේපය**

දේශීය අර්තාපල් වගාව ආරම්භයේ සිටම අස්වැන්න විකුණාගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන් තුළ උඩරට ගොවිහු විවිධ ගැටලු වලට මුහුණ පාමින් සිටී. එහි වඩාත්ම අහිතකර ප්‍රතිඵලය වන්නේ, විශාල මුදලක් යටකර අර්තාපල් වගාවේ යෙදුන ද අවසානයේ අර්තාපල් සඳහා හොඳ වෙළඳපලක් නොවීමත් ස්වභාවික හා අනෙකුත් සාධක නිසා අස්වැන්න පහත බැසීමත් ය. පර්යේෂණ අධ්‍යයන ගැටලුව ලෙස හඳුනා ගෙන ඇත්තේ, යොදවන මුදලට සාපේක්ෂව අර්තාපල් වගාවෙන් ගොවීහු ලබන ශුද්ධ ආදායම අවම මට්ටමක පැවතීමයි. ආදායම අඩුවීමට වගාවට යොදා ගන්නා බීජ අර්තාපල් වල, පොහොර, රසායනික ද්‍රව්‍යවල මිල ඉහළ යෑම හා දේශගුණික සාධක බලපා ඇති බව උපකල්පනය කර ඇත. වගාව සඳහා යොදන පිරිවැයෙහි වටිනාකමට වඩා දෙගුණයක්වත් ආදායම නැතිනම් අවාසිදායක වගාවක් ලෙස කල්පිතයක් ගොඩනගා ඇත. 2016 වර්ෂයේ පළවෙනි මඩඉඩම් වල අර්තාපල් කන්නය (ජූනි - සැප්තැම්බර්) වැලිමඩ උඩුහාවර ග්‍රාමයේ ගොවීහු 20ක් සසම්භාවි ලෙස තෝරාගෙන ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ද ඌවපරණගම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් හා කහගොල්ල කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලබාගන්නා ද්විතික දත්ත පාදක කොට ගෙන මෙම පර්යේෂණය සිදු කොට ඇත. එක්රැස් කරගත් තොරතුරු දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව, ඉහත උපකල්පනයන් පර්යේෂණ ගැටලුවට හේතු වූ බව පැහැදිලි ය. මීට අමතරව වර්තමානයේ පවතින වියළි කාලගුණය අර්තාපල් වගාවට අයෝග්‍ය ලෙස බලපා ඇත. අඛණ්ඩව ප්‍රමිතියකින් තොරව රසායනික ද්‍රව්‍ය යෙදීම නිසා ප්‍රදේශයේ පාංශු හායනය හේතුවී ඇත.මේ සඳහා ජාතික ප්‍රතිපත්ති වශයෙන් පොහොර සහනාධාරය නැවත ක්‍රියාත්මක කිරිම, ණය අරමුදල් ලබාදීම, පාංශු හායනය වලක්වා ගැනීමට උපදෙස් ලබාදීම, ජලසම්පාදනය ක්‍රමවත් කිරිම ආදිය යෝජනා ලෙස දැක්විය හැක.

**මුඛ්‍ය පද :** වැලිමඩ, අර්තාපල් වගාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thiwankadanze@gmail.com